මන්මුනෙයි නිර්ත ප්‍රාදේශිය සභාව

මඩකලපුව දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශ න

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 22 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 08 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව, මන්මුනෙයි නිර්ත ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි නිර්ත ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිසම්පාදන සංචිතය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) වටිනාකම රු.102,009 ක් වූ තොගය හරිවැරදි බැලූ වටිනාකමට නොව පොත් අගයට මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර තිබුණි.

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.1,053,645 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,873,257 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇසතමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු .000' | රු. 000' | රු.000' |
| (i) වරිපනම් සහ බදු | 4 | 2 | 2 |
| (ii) කල්බදු කුලී | 1,608 | 671 | 937 |
| (iii) බලපත්‍ර ගාසතු | 585 | 453 | 132 |
| (iv) වෙනත් ආදායම් | 3,580 | 407 | 3,173 |

#### 2.2.2 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ වෙනත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ මුද්දර ගාස්තු ප්‍රමාණය රු.2,185,299 ක් විය.

## 3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර කළමනාකරණය

(ඈ) අයවැය පාලනය